# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## අධ්‍යක්ෂ - නීති කටයුතු තනතුරට බඳවා ගැනීම (බාහිර )

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ඉහත තනතුරේ පුරප්පාඩුව ස්ථිර පදනම මත පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**(1) රැකියා විස්තරය**

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සම්බන්ධ නඩු කටයුතු සහ අනෙකුත් නීතිමය කටයුතු මෙහෙයවීමේ දී නීති උපදෙස් සහ නෛතික මතයන් ලබා දීම.
2. නීතිපති දෙපාර්තමේන්තුව සහ නීතිඥවරුන් සමඟ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙනුවෙන් කටයුතු සම්බන්ධීකරණය කිරීම
3. "නීතිමය අවශ්‍යතා තහවුරු කිරීමේ ක්‍රියා පටිපාටි" පිළිබඳ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමෙහි ලා සහාය වීම.
4. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම්වලට අදාළ නීතිමය ලියකියවිලි කෙටුම්පත් සහ සැලකිරීම් පිළියෙල කිරීම.
5. නීතිමය කටයුතු/නීති අධිකරණ සහ කම්කරු විනිශ්චය සභා සමඟ සිදු කරනු ලබන සියලුම නීති කටයුතු සම්බන්ධීකරණය කිරීම.

**(2) අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:**

නීති විෂයය ක්ෂේත්‍රයේ 1 වන හෝ 2 වන පන්තියේ ගෞරව උපාධිය සහ පශ්චාත් උපාධිය සමඟ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 20 ක සතුටුදායක සේවා පළපුරුද්ද සහ එයින් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම .

හෝ

නීති විෂයය ක්ෂේත්‍රයේ 1 වන හෝ 2 වන පන්තියේ ගෞරව උපාධිය සහිත නීතිඥයෙකු වීම සහ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 20 ක සතුටුදායක සේවා පළපුරුද්ද සහ එයින් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම .

හෝ

නීති විෂයය ක්ෂේත්‍රයේ උපාධියක් සහ පශ්චාත් උපාධිය සහිත දීප ව්‍යාප්ත සේවාවක I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

හෝ

නීති ක්ෂේත්‍රය පිළිබඳ උපාධිය ලබා තිබීම, නීතිඥවරයෙකු වීම සහ දීප ව්‍යාප්ත සේවාවක I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

**(3) බඳවා ගැනීමේ පටිපාටිය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කෙරේ.

**(4)** වැටුප :- :- TRC 1.3 -Rs. 156,400 (10x6256) -(10x7038) – 289,340

**(5)** **වයස :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 24-55 විය යුතුය.

**(6) අයදුම් කිරීමේ ක්‍රමය**

1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk. වෙතින් බාගත කර ගත හැකිය.
2. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා නොසපුරන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
5. සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව **2025.05.14 දින හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **අධ්‍යක්ෂ / නීති කටයුතු තනතුර සඳහා අයදුම්පත** යනුවෙන් සඳහන් කළ යුතුය.
6. අයදුම්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතික සමඟ careers@trc.gov.lk විද්‍යුත් තැපැලට එවිය යුතුය. විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව " **අධ්‍යක්ෂ / නීති කටයුතු තනතුරට බඳවා ගැනීම - 2025** " විය යුතුය.
7. රජයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
8. අයදුම්පත් **2025.05.14 දින හෝ එදිනට පෙර** ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

**(7) පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා ඍජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක 276
ඇල්විටිගල මාවත
කොළඹ 08